**මහ සභාවාර්තාව - වලිමඩ ප්‍රාදේශීය සභාව**

**2023 පෙබරවාරි 27 - වේලාව- පෙ.ව 10.30**

මෙදින පෙ.ව 10.25 ට මුලාසනය දැරූ ගරු සභාපතිතුමාවිසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමිය ගරු මන්ත්‍රීමණ්ඩලය, සභාලේකම්තුමා කාර්ය මණ්ඩලය,මාධ්‍යවේදී මහතුන් ඇතුළු සියළු දෙනාපිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

**පැමිණීම**

| අනු අංකය | තනතුර | මන්ත්‍රීවරයාගේනම | පැමිණි වේලාව |
|---|---|---|---|
| 1 | ගරු සභාපති | එස්.ඒ.ආර්.බන්දුසේනමන්ත්‍රීතුමා | 10.20 |
| 2 | ගරු උප සභාපති | සීතාසමරවීර මන්ත්‍රීනිය | 10.10 |
| 3 | ගරුමන්ත්‍රීනි | එස්.ඒ.ආර්.ඥානවතී මන්ත්‍රීනිය | 9.30 |
| 4 | ගරුමන්ත්‍රී | ජේ.එම්.ඉන්දික සම්පත් මන්ත්‍රීතුමා | 9.30 |
| 5 | ගරුමන්ත්‍රී | එම්.එම්.සුජිත් කුමාර මන්ත්‍රීතුමා | 9.30 |
| 6 | ගරුමන්ත්‍රී | වජිරදෙනගම අතපත්තු මන්ත්‍රීතුමා | 9.50 |
| 7 | ගරුමන්ත්‍රී | ආර්.ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්.බී.මිරහවත්ත මන්ත්‍රීතුමා | 9.50 |
| 8 | ගරුමන්ත්‍රී | ඒ.ඒ.මහම්මදු ඉල්ලියාස් මන්ත්‍රීතුමා | 10.00 |
| 9 | ගරුමන්ත්‍රී | ඩී.පී.ජයතිලක මන්ත්‍රීතුමා | 9.35 |
| 10 | ගරුමන්ත්‍රී | එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මන්ත්‍රීතුමා | 10.00 |
| 11 | ගරුමන්ත්‍රී | අබ්දුල් කරීම් අබ්දුල් මුත්තලිප් මන්ත්‍රීතුමා | 9.45 |
| 12 | ගරුමන්ත්‍රී | මොහොමඩ් අලීම් මොහොමඩ් ෆායිස් සයිබුමන්ත්‍රීතුමා | 9.50 |
| 13 | ගරුමන්ත්‍රී | බී.ආර්.පද්මසිරි කුමාර මන්ත්‍රීතුමා | 10.30 |
| 14 | ගරුමන්ත්‍රී | වසන්ත නානායක්කාර මන්ත්‍රීතුමා | 9.45 |
| 15 | ගරුමන්ත්‍රී | ඩබ්.එම්.අජිත් ප්‍රේමලාල් මන්ත්‍රීතුමා | 10.00 |
| 16 | ගරුමන්ත්‍රී | ඩබ්.එම්.ගාමිණී ජයන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා | 10.00 |
| 17 | ගරුමන්ත්‍රී | එම්.එම්.නාළක මනතුංග බණ්ඩාර මන්ත්‍රීතුමා | 9.30 |
| 18 | ගරුමන්ත්‍රී | වී.රාසලිංගම් මන්ත්‍රීතුමා | 9.30 |
| 19 | ගරුමන්ත්‍රීනි | ඩබ්.එන්.ඩබ්.දුලාංජනී ප්‍රියදර්ශිකාමන්ත්‍රීනිය | 10.00 |
| 20 | ගරුමන්ත්‍රී | ඩී.එම්.ජයසිංහ මන්ත්‍රීතුමා | 10.00 |
| 21 | ගරුමන්ත්‍රී | ඩබ්.ඩී.කුලරත්න මන්ත්‍රීතුමා | 9.50 |
| 22 | ගරුමන්ත්‍රී | එච්.එම්.නිල්මිණී ස්වර්ණමාලීමන්ත්‍රීණිය | 9.45 |
| 23 | ගරුමන්ත්‍රී | ඩබ්.එම්.තිස්ස නාළක විජේසූරිය මන්ත්‍රීතුමා | 9.50 |
| 24 | ගරුමන්ත්‍රී | ආර්.එම්.අමරසේන මන්ත්‍රීතුමා | 9.45 |
| 25 | ගරුමන්ත්‍රී | ඒ.ඩබ්.ආර්.එම්.සාන්ත අමරකෝන් මන්ත්‍රීතුමා | 9.50 |
| 26 | ගරුමන්ත්‍රී | ජේ.එල්.රංජිත් මන්ත්‍රීතුමා | 9.00 |
| 27 | ගරුමන්ත්‍රී | ඒ.සී.එම්.මහරූෆ් මන්ත්‍රීතුමා | 9.00 |
| 28 | ගරුමන්ත්‍රීනි | ජේ.පී.එස්.චන්ද්‍රකාන්ති මැණිකේ විමලසේන මන්ත්‍රීනිය | 10.00 |
| 29 | ගරුමන්ත්‍රී | ආර්.බී.ජයතිලක මන්ත්‍රීතුමා | 9.20 |
| 30 | ගරුමන්ත්‍රීනි | ඩබ්.ඩබ්.නිමාළි නිරංජලාමන්ත්‍රීනිය | 10.00 |
| 31 | ගරුමන්ත්‍රී | එම්.එම්.දයාරත්න මන්ත්‍රීතුමා | 9.45 |
| 32 | ගරුමන්ත්‍රී | එච්.එම්.නාළක ප්‍රියන්ත කුමාර මන්ත්‍රීතුමා | 9.45 |
| 33 | ගරුමන්ත්‍රීනි | බී.ඩී.සුනේත්‍රාමන්ත්‍රීනිය | 10.15 |
| 34 | ගරුමන්ත්‍රී | තමෙද්දරම් මහේන්ද්‍ර කුමාර් මන්ත්‍රීතුමා | 9.30 |
| 35 | ගරුමන්ත්‍රී | එල්.ඒ.ප්‍රියන්ත චාමින්ද මන්ත්‍රීතුමා | 9.45 |
| 36 | ගරුමන්ත්‍රී | එච්.එම්.කරුණාරත්න බණ්ඩාර මන්ත්‍රීතුමා | 10.00 |
| 37 | ගරුමන්ත්‍රීනි | ටී.එම්.චන්ද්‍රිකාතෙන්නකෝන් මන්ත්‍රීනිය | 9.45 |
| 38 | ගරුමන්ත්‍රීනි | ඩී.පී.චන්ද්‍රිකාමන්ත්‍රීනිය | 9.00 |
| 39 | ගරුමන්ත්‍රී | එච්.එම්.කරුණාරත්නමන්ත්‍රීතුමා | 9.50 |
| 40 | ගරුමන්ත්‍රීනි | එච්.වී.එන්.කුසුම් කුමාරි මන්ත්‍රීනිය | 10.10 |
| 41 | ගරුමන්ත්‍රී | ඩී.එම්.අජිත් කුමාර මන්ත්‍රීතුමා | 9.55 |

**01- <u>2023.01.23 දින මහ සභාවාර්තාව</u>**

ගරු මන්ත්‍රී මිරහවත්ත මන්ත්‍රීතුමා පවසා සිටියේ ගරු සභාපතිතුමාට සභා අරමුදලින් වියදම් දැරීමට ඇති බලය රු.250000/-ක මුදල සම්බන්ධව සාකච්ඡාවූ බවත්, එම මුදල එලෙසම ක්‍රියාත්මක වෙනවාද යන්නත් නැත්නම් එයට සභා සම්මතයක් ගත යුතුද යන්න විමසන ලදී. එසේම අත්‍යවශ්‍ය කටයුතු සඳහා ගරු සභාපතිතුමාට වියදම් කිරීමට යම් මුදලක් වෙන් කරන බවත්. එසේ මාසිකව වියදම් කරන මුදල් පිලිබඳ විස්තරයක් මහ සභාවට ඉදිරිපත් කල යුතු බවත්,පසුගිය අවුරුදු දෙක පුරාවට එය ඉදිරිපත් නොකළ බවත්,පවසන ලදී.මෙම මුදල සංශෝධනය නොවන බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදී. ලේකම්තුමා ගරු මන්ත්‍රී මිරහවත්ත මන්ත්‍රීතුමා පවසා සිටියේ ගරු සභාපතිමා විසින් වියදම් කරන මුදල් පිලිබඳ දත්ත වාර්තාවක් ගරු මන්ත්‍රී මන්ඩලයට ලබාදෙන ලෙසයි.ගරු මන්ත්‍රී සම්පත් මන්ත්‍රීතුමාද පවසා සිටියේ රු.250000/- තුළ ගරු සභාපතිතුමගේ අභිමතය පරිදි වියදම් පිලිබඳ වාර්තාවක් ලබාදෙන ලෙසයි.එය ඉදිරිපත් කරන ලෙස ලේකම්තුමා ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

2023.01.23 දිනැති මහ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ආර්.බී.ජයතිලක මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී රාසලිංගම් මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදි. ඒ අනුව 2023.01.23 දිනැති මහ සභා වාර්තාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**02- ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන -**

**03- සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන** - නැත

**04- යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න** - නැත

**05- යථාපරිදි කල්දී ඇති යෝජනා-**

1. **<u>ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරණු ලබන කඩ පැවරුම් සම්බන්ධ යෝජනාව</u>**

කඩ පැවරුම් ගාස්තු සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගැනීම සඳහා මහ සභාව වෙත ඉදිරිපත් කරමි. අදාළ සංශෝධනයන් පහත පරිදි වේ.

01. වලිමඩ ප්‍රධාන කාර්යාලයට අයත් කඩ සඳහා කඩ පැවරුමු ගාස්තු - රු.300000/- (තුන්ලක්ෂයයි)
02. ප්‍රාදේශීය සභා උප කාර්යාල වලට අයත් කඩ සඳහා පැවරුම් ගාස්තු - රු.250000/-(දෙලක්ෂ පනස්දහසයි
03. ඥාතීත්වය මත පැවරීමේදී කඩ පැවරුම් ගාස්තු -රු.25000/-(විසිපන්දහසයි)

**ස්ථිර කිරීම - ගරු මන්ත්‍රී ඩී.පී.ජයතිලක මන්ත්‍රීතුමා**

**<u>ගරු සභාපතිතුමා</u>**

ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරණු ලැබූ කඩ පැවරුම් ගාස්තු සංශෝධනය කිරීම සම්බන්ධ යෝජනාව සභා අනුමැතිය ලබාගැනීම පිණිස ගරු මූලාසනය විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.එහිදී ගරු සභාව විසින් මේ සම්බන්ධව සාකච්ඡා කිරීමෙන් අනතුරුව 2023.02.27 දින සිට ඉහත සඳහන් ආකාරයට කඩ කුළී සංශෝධනය කිරීමට තීරණය කරන ලදී. එම තීරණය සඳහා ගරු මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසා සිටි අතර සභාවේ සියළු සභිකයින් එකඟතාවය පලකරන ලදි. ඒ අනුව එම යෝජනාව 2023.02.27දින මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**<u>02</u>**

**<u>ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරණු ලබන පහත සඳහන් මුද්‍රණ යන්ත්‍ර අළුත්වැඩියා සඳහා කරණු ලබන හදිසි යෝජනාව</u>**

1) කැප්පෙටිපොළ උප කාර්යාල ටෝෂිබා අනු පිටපත් යන්ත්‍රය අවත්වැඩියාව සඳහාවූ ඇස්තමේන්තුව -රු. 236323.69
2) වැ/ප්‍රා/ස/2/3 විෂයෙහි SAMSUNG මුද්‍රන යන්ත්‍රය අවත්වැඩියාව

**ස්ථිර කිරීම - ගරු මන්ත්‍රී ඩී.පී.ජයතිලක මන්ත්‍රීතුමා**

**<u>ගරු සභාපතිතුමා</u>**

ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරණු ලැබූ මුද්‍රන යන්ත්‍ර අළුත්වැඩියා සඳහා වන ඇස්තමේන්තු අනුමත කර ගැනීම සඳහා වන යෝජනාව සභා අනුමැතිය ලබාගැනීම පිණිස ගරු මූලාසනය විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.එහිදී ගරු සභාව විසින් මේ සම්බන්ධව සාකච්ඡා කිරීමෙන් අනතුරුව කැප්පෙටිපොළ උප කාර්යාල ටෝෂිබා අනු පිටපත් යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා වූ රු. 236323.69 ඇස්තමේන්තුව හා වැ/ප්‍රා/ස/2/3 විෂයෙහි SAMSUNG මුද්‍රන යන්ත්‍රය අළුත්වැඩියාව කිරීම අනුමත කරන ලදී. මේ සඳහා ගරු මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසා සිටි අතර සභාවේ සියළු සභිකයින් ඒ සඳහා එකඟතාවය පලකරන ලදි. ඒ අනුව ඉහත සඳහන් ඇස්තමේන්තු 2023.02.27 දින මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**03 <u>ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන 2023.02.13 මුදල් කමිටුවට ඉදිරිපත් කළ ලිපි සඳහා අනුමැතිය ලබාගැනීම සම්බන්ධ යෝජනාව.</u>**

මෙම අවස්ථාවේ ගරු මන්ත්‍රී මහරූප් මැතිතුමා පවසා සිටියේ මුදල් කමිටු වාර්තාවේ බෝක්කු බට සඳහා යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත්, එහෙත් මේ සඳහා මීට පෙර මා යෝජනාවක් භාර දුන් බවත්, එහෙත් එය ක්‍රියාත්මක නොවූ බවත්, ප්‍රදේශයේ යෝජනා භාර ගන්නාවිට මන්ත්‍රීවරයාගේ නිර්දේශය මත පමණක් යෝජනා භාර ගන්නා ලෙසත්, මෙම ස්ථානය සඳහා බෝක්කු බට දැමීම සුදුසු නොවන බවත්, පවසන ලදී.
ගරු සභාපතිතුමා පවසා සිටියේ පසුගිය දිනයන්හි මිනිසුන් බොහොමයක් යෝජනා ගෙනවිත් දුන් බවත්.ඒවා ප්‍රතික්ෂේප කිරීමේ හැකියාවක් මා හට නොමැති බවත්, පක්ෂ පාට භේදයකින් තොරව වැලිමඩ ප්‍රදේශයේ යෝජනා මා භාරගත් බවත්, ඒවා මුදල් කමිටුවට ඉදිරිපත් කල බවත්, මේවා ක්‍රියාත්මක කිරීම සඳහා මහ සභා අනුමැතිය අවශය බවත්, මැතිවරණ සමයක් නිසා මෙම යෝජනා ක්‍රියාත්මක නොවන බවත්, පවසන ලදී.
ගරු මන්ත්‍රී ප්‍රභාත් රවීන්ද්‍ර මැතිතුමා පවසා සිටියේ මුදල් කමිටු වාර්තාවේ 13 වෙනි කරුණ යටතේ කැප්පෙටිපොළ හා බොරලන්ද පොදු වැසිකිළි කඩාඉවත් කිරීමට යෝජනා කර ඇති බවත්, එහිදී මෙම කටයුතු සිදු කිරීමේදී ප්‍රදේශයේ විරුද්ධත්වයක් ඇති වීමට ඉඩ ඇති බවත්, එම නිසා අළුතින්ම ඉදිකල මෙම වැසිකිළි කඩාඉවත් කිරීම සුදුසු නොවන බවත්, මෙය මාගේ තනිමතය නොව අප කණ්ඩායමේ මතය බවත්, පවසන ලදී. එසේම 14වෙනි හා15 වෙනි යෝජනාවන්හි එම කමිටු සඳහා අප පක්ෂයේ සාමාජිකයන් පත් කරන ලෙසත්, එසේම මෙහි සඳහන් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක නොකරන ලෙසත්, දන්වන් ලදී.
ගරු මන්ත්‍රී සුනේත්‍රා මැතිනිය පවසා සිටියේ පොදු මතයට ඉඩ ලබා දී මා ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනාද හකුලා ගන්නා බවත්,එහෙත් බස් හෝල්ට් සම්බන්ධව ඉදිරිපත් කරන ලද යෝජනාව මා හට පමණක් අදාළ නොවන බවත්, මෙය මන්ත්‍රීවරු සියළු දෙනාට අදාළ බවත්, එම නිසා මෙය ක්‍රියාත්මක කිරීමට මා යෝජනා කරන බවත්, පවසන ලදී.එම යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රභාත් රවීන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
ගරු මන්ත්‍රී ඉන්දික සම්පත් මැතිතුමා පවසා සිටියේ LDPS ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කමිටුව 2023 වර්ෂය සඳහා අළුත් කර නොමැති බවත්, එම නිසා එම කමිටුව අළුතින් පත් කරන ලෙසත්, මුදල් කමිටු වාර්තාවේ 15 කරුණ යටතේ LDPSව්‍යාපෘතියේ සමාජ විගනන කමිටුව මෙසේ පත්කිරීමට හැකියාවක් නොමැති බව මාගේ මතය බවත්, මෙහි ගරු මන්ත්‍රිණී ඥානවතී මැතිනියගේද නම ඇතුලත් බවත්. මෙහි කිසිදු විනිවිධ භාවයක් නොමැති බවත්, මෙම යෝජනාව සභාවේ අනුමත කල නොහැකි බවත්, මෙම වැසිකිළි කඩා දැමීම තුළින් මන්ත්‍රීවරයෙක්ට අධිභාරයක් පැමිණියහොත් ඒ සඳහා වගකියන්නේ කව්රුවිද යන වගත්, මෙම යෝජනා හරහා කැප්පෙටිපොළ හා බොරලන්ද නගරය තුළ ඉදිකිරීම මගින් අවුරුදු ගණනාවක් ව්‍යාපාර කරන ලද හෝටල් සේවකයන්ට මෙතුලින් පහර වදින බවත් එම නිසා මෙම බෝජුන්හල් ඉදිකිරීම සඳහා පක්ෂයක් ලෙස අපගේ විරුද්ධත්වය ප්‍රකාශ කරන බවත්, කොට්ඨාශවල සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීමේදී එම යෝජනා අදාළ කොට්ඨාශයේ මන්ත්‍රීවරයාගේ නිර්දේශය මත පමණක් ලබාගන්නා ලෙස දිගින් දිගටම අප ප්‍රකාශ කලත් එය සිදු නොවූ බවත්,මෙම සංවර්ධන යෝජනා සඳහා මහ සභා අනුමැතිය ලබා නොදෙන බවත්, පවසන ලදී.
ගරු මන්ත්‍රී අජිත් කුමාර මැතිතුමා පවසා සිටියේ මුදල් කමිටු වාර්තාවේ 13 වෙනි කරුණ මගින් LDPS ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 24.7 වෙන් කර ඇති බව සඳහන් කර 36වෙනි යෝජනාවෙන් ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රතිපාදන මුදල් සීමාව ඉක්මවන්නේනම් , අමතර මුදල සභා අරමුදලින් යෙදවීමට අනුමතිය ලබාගැනීම යනුවෙන් සඳහන් කර ඇති බවත්, අවධානයෙන් බලන කළ මෙම මුදල් ප්‍රමාණය මේ සඳහා ප්‍රමාණවත් නොවන බවට අපට හැඟී යන බවත්, අනිවාර්යයෙන් මේ සඳහා සභා අරමුදලෙන් මුදල් යෙදවීමට සිදු වන බවත්. මේ සඳහා අනුමැතිය ලබාදීම අපගේ ධූර කාලය හා සලකා බලන විට අවධානම් සහගත කරුණක් බවත්, වැසිකිළි ඉවත් කිරීමේදී ඒ සම්බන්ධව වාර්තාවක් සභාවට ඉදිරිපත් කළ යුතුව තිබූ බවත්, 15 කරුන යටතේ සමාජ විගණනයක් සිදු විය යුතු බවත්, එහෙත් මෙහි විනිවිදභාවයක් නොමැති බවත්, මේ සම්බන්ධව විධිමත් දැනුවත්භාවයක් මන්ත්‍රීවරුන්ට නොලැබුනු බවත්, 15 කරුනටද අප පාර්ශවයේ විරෝධය ප්‍රකාශ කරන බවත්, සඳහන් කරන ලදී.
ගරු මන්ත්‍රී නානායක්කාර මැතිතුමා පවසා සිටියේ සභාවේ අවසාන අදියරේ අප සිටිනා බවත්, මුදල් කමිටුවේ අනුමැතිය නොව ලබාදෙන්නේ නිර්දේශය බවත්, යම් වැඩසටහන් ක්‍රියාත්මක කිරමට නම් සහ සභා අනුමැතිය ලබාගත යුතුම බවත්, සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමේදී මන්ත්‍රී නිර්දේශය මත පමණක් සිදු කරන ලෙස ඔබතුමාට අවස්ථා කිහිපයකදීම දැනුවත් කල බවත්, එහෙත් එය එසේ සිදු නොවන බවත්, සමහර සංවර්ධන යෝජනා කොට්ඨාශයේ මන්ත්‍රීවරයා නොදන්නා බවත්, එය මන්ත්‍රීවරයාගේ අභිමානයට හානියක් බවත්. 2018 හෙළ බෝජුන්හල් යෝජනාව මා ගෙන ආවේ බොරගස් හුළංකපොල්ල ප්‍රදේශයේ ස්ථානයකට බවත්, එය ගොඩනගා තිබුනා නම් එම ප්‍රදේශයේ විශාල සංවර්ධනයක් එතුලින් ඇතිවන බවත්, බෝජුන්හල් විශාල ප්‍රමාණයක් ඉදිවී ඇත්තේ නගරයෙන් පරිභාහිරව බවත්,කැප්පෙටිපොළ හා බොරලන්ද සම්බන්ධව ප්‍රමුඛතාවය ආවේ කෙසේද යන්න ගැටළුවක් බවත්, මේ අවස්ථාවේ මේ සියල්ල නතර කරමු කියාත්, 2023 වර්ෂයේ නව සභාපතිවරයා හා මන්ත්‍රී මණ්ඩලයට එම කටයුතු කරගෙන යාමට ඉඩ ප්‍රස්ථාව සලසමු කියාත්, මාගේ පෞද්ගලික විරෝධතාවය මේ සඳහා ප්‍රකාශ කරන බවත්, පවසන ලදී.
ගරු මන්ත්‍රී නාළක මනතුංග මැතිතුමා පවසා සිටියේ වැසිකිළි කැඩීමට අවශ්‍යතාවයක් නොමැති බවත්, පුහුල්පොළ හොඩයරබාහංදියේ මෙම බෝජුන්හල් ස්ථාපනය කිරීමට සුදුසුම ස්ථානය බවත්, මෙම ස්ථාන දෙකේ මෙය ඉදිකරමු කියාත් යෝජනා කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා පවසා සිටියේ සම්පත් මන්ත්‍රීතුමා පවසූ පරිදි මෙහිදී අධිභාරයක් සිදු වුවහොත් එය මා ගෙවන බවට පොරොන්දු වන බවත්, මෙම ස්ථාන දෙක තෝරාගැනීමට හේතුව වූයේ මෙම ඉඩම් නිරවුල් ඔප්පු සහිත ඉඩම් නිසා බවත්. අනෙත් ස්ථාන දෙකේ ඉඩම් සම්බන්ධව ගැටළු ඇති බවත්, මෙම ව්‍යාපෘතිය මගින් අංග සම්පූර්ණ වැසිකිළි පද්ධතියක් හා ව්‍යාපාරික ස්ථාන කිහිපයක් ඇති වන බවත්, මෙතුලින් විශාල පිරිසකට සේවයක් සැපයෙන බවත්, මෙම මුදල ගරු ලේකම්තුමා හා අප නිළධාරී මණ්ඩලය ඉතා මහන්සියෙන් දිනාගත් මුදලක් බවත්, මේ සඳහා විරුද්ද වී ඔබතුමන්ලා සිදු කරන්නේ ජාතික අපරාදයක් බවත්, මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රධානය කර ඇති මෙම මුදල ජූනි මාසයෙන් පසු යොදවාගැනීමට නොහැකි බවත්, එසේම කිසිදු සංවර්දන යෝජනාවක් ක්‍රියාත්මක නොකරන බවත්, පවසන ලදී.
මේ සම්බන්දව දීර්ඝ වශයෙන් සාකච්ඡා වීමෙන් පසු ගරු මන්ත්‍රී සම්පත් ජයසුන්දර මැතිතුමා විසින් මුදල් කමිටු වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කරන ලදී එනම් සියළුම මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය පරිදි LDPSව්‍යාපෘති යෝජනාවේ කැප්පෙටිපොළ හා බොරලන්ද පොදු වැසිකිළි කඩාඉවත් කර බෝජුන්හල් ඉදිකිරීම යන යෝජනා සම්බන්ධව අප දැනුවත් වූයේ මුදල් කමිටු වාර්තාව ලැබුණු පසු බවත්, එම නිසා මෙම බෝජුන්හල් කැප්පෙටිපොළ හා බොරලන්ද නගර මධ්‍යයේ ඉදි නොකර ගරු මන්ත්‍රී මණ්ඩලයේ 41දෙනා සමඟ සාකච්ඡා කර තීරණයක්

ගෙන පසුව ක්‍රියාත්මක කිරීමට යෝජනාකරන ලදී. එම සංශෝධිත යෝජනාව ගරු මන්ත්‍රී කරුණාරත්න බණ්ඩාර මන්ත්‍රීතුමාවිසින් ස්ථිර කරන ලදී.

1. **වැලිමඩ ප්‍රාදේශීය සභාවට අයත් නාගරික තුරු උයන සහ ළමාඋද්‍යානය සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්තුමා යොමු කර ඇති ලිපිය**

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ කලාප භාර විමර්ශන නිලධාරී විසින් සභාවට අයත් නාගරික තුරු උයන සහ ළමාඋද්‍යානය නිසි නඩත්තුවකින් තොරව පවතින බව නිරීක්ෂණය වූ බවට කරුනු ඉදිරිපත් කරමින් විමර්ශන වාර්තාව ඉදිරිපත්කර ඇති බවත්, ඒ අනුව මෙම උද්‍යානය නිසි ලෙස නඩත්තු කර පිරිසිදුව පවත්වාගෙන යාමේ වගකීම සභාව සතු වන බව සදහන් කරමින් අවශ්‍ය පියවර ගන්නාලෙස සදහන් කරමින් පළාත් පාලන කොමසාරිස්තුමායොමු කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

මෙම නාගරික තුරු උයන පිරිසිදු කිරීමේ කටයුතු මෙ වන විට අවසන් කර ඇති බව සදහන් කරමින් එහි ජී.අයි. බට, බංකු, ගේට්ටු හා වැට තීන්ත ආලේප කිරීම සදහාඅවශ්‍ය ද්‍රව්‍ය ලබාදෙන ලෙස ඉල්ලමින් ජී.නානායක්කාර මහතාඉදිරිපත් කර ඇති ලිපියද මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

ඒ අනුව මෙම ස්ථානයේ ඇති විශාල ටර්පන්ටයින් ගස් දෙක පළමුවෙන්ම ඉවත් කර ඉන් පසු එහි සංවර්ධන කටයුතු සිදු කිරීම සුදුසු බව කාර්මික නිළධාරී විසන්පද පෑහැදිලි කල අතර, ඒ අනුව ටර්පන්ටයින් ගස් දෙක කැපීම හාඉවත් කිරීම සදහාමිල ගණන් කැදවාඅවශ්‍ය කටයුතු සිදු කිරීමටත්, ඉන් පසු තුරු උයනේ සංවර්ධන කටයුතු සිදු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සදහාමහ සභාඅනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී ගාමිණී ජයන්ත මන්ත්‍රීතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

2. **ජාතික ලොතරැයි මණ්ඩලයේ අලෙවි කටයුතු සම්බන්ධව ජාතික ලොතරැයි මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය**

වැලිමඩ නගරයේ දැනට ලොතරැයි අලෙවි කුටි 12ක අලෙවි කටයුතු සිදු වන අතර මහා කළයේ මාර්ග සංවර්ධන කටයුතු හානගර සැලසුම්කරණ වැඩසටහන යටතේ අලෙවි කුටි පහක් ඉවත් කර ඇති අතර, ප්‍රාදේශීය සභාව මගින් ලොතරැයි අලෙවි කුටි ලබාදීමේදී ඉවත්කල කුටි පහද ඇතුළුව අලෙවි කුටි 17 ක් පහත නම් සදහන් අලෙවි නියෝජිතයින් වෙත ලබාදෙන ලෙස දන්වමින් ජාතික ලොතරැයි මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

- ඩබ්.ඒ.විජේරත්න මහතා(140003) 05
- විමලදාස රත්නායක මහතා(140022) 02
- ශාන්ත කුමාර මහතා(140066) 07
- මහිත නිලංග මහතා(100178) 03

ජාතික ලොතරැයි මණ්ඩලය මගින් එවාඇති මෙම ලිපියේද පිටපතක් සහිතව, සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙතද ලිපියක් යොමු කර ලොතරැයි කුඩු සැකසුනිමකර කර ඇති බව දන්වාලොතරැයි කුඩු ලබාදීමට සුදුසු පුද්ගලයින් පෞරෝන්දු වූ පරිදි තෝරාදෙන ලෙස දන්වමින් ලිපියක් යොමු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සදහාමහ සභාඅනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී ඉල්ලියාස් මන්ත්‍රීතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

3. **බෝගහකුඹුර ප්‍රාදේශීය සභාවේ පෙර පාසල ආරම්භ කිරිම සම්බන්ධව මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ විසින් යොමු කර ඇති ලිපිය**

බෝගහකුඹුර ප්‍රාදේශීය සභාවේ පෙර පාසල ආරම්භ කිරිමත් සමඟ අවට පෙර පාසල් පවත්වාගනෙ යාමට අපහසු බව පහත සදහන් කරුණු අනුව මුල් ළමාවිය සංවර්ධන නිලධාරී විසින් පෙන්වාදී ඇති බව සදහන් කරමින් මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ විසින් යොමු කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

- ප්‍රාදේශීය සභාපෙර පාසලේ දැනට එකතු කරන මාසික ගාස්තුව රු.200.00ක් වැනි අවම මුදලක් නිසාදෙමාපියන් වැඩි ප්‍රමාණයක් ළමයින් ඇතුලත් කිරීම
- බෝගහකුඹුර සිතුමිණ පෙර පාසලේ පෝෂක ප්‍රදේශයේ ළමයින්ද මෙම පෙර පාසලට ඇතුලත් කිරීම

ඉහත සදහන් හේතු නිසාසිතුමිණ පෙර පාසලේ ළමයින් 05ක් දක්වාඅඩු වීඇති අතර මෙමගින් ගැටලුකාරී තත්වයක් ඇති වී ඇති බැවින් පහත යෝජනාඉදිරිපත් කර ඇත.

- සිතුමිණ පෙර පාසලේ ගුරුතුමිය සුදුසුකම් ලත් ගුරුවරියක් වන බැවින් ඇයට ප්‍රාදේශීය සභාපෙර පාසලේ සේවය කිරීමට අවස්ථාව ලබාදීම
- මේ වන විට ප්‍රාදේශීය සභාව විසින් අය කරන මුදල යම් ප්‍රමාණයකින් වැඩි කිරීම

ඉහත සදහන් යෝජනාඉදිරි කටයුතු සදහා ඉදිරිපත් කරන අතර එම ගුරුවරුන් හට සාධාරණයක් ඉටු කර දෙන ලෙස ඉල්ලාඇත.

එමෙන්ම වැලිමඩ පෙර පාසල් ගුරුවරුන්ට තිබෙන ගැටලු පිළිබඳ දැනුවත් කිරීම යන මාතෘකාවෙන් යුක්තව වැලිමඩ පෙර පාසල් ගුරු සංගමය විසින් යොමු කර ඇති ලිපිය අනුව වැලිමඩ කෝන්ගස්වත්ත වැලිමඩගම යන ස්ථානයේ කිසිදු නීත්‍යානුකූල පදනමකින් තොරව ආරම්භ කර ඇති පෙර පාසල නිසාවසර ගණනාවක් පවත්වාගෙන ආ ඒ අවට පෙර පාසල් වලට දැඩි තර්ජනයක් වී ඇති බැවින් ඒ සදහා විසදුමක් ලබාදෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත්කර ඇති ලිපියද මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

ඒ අනුව වැලිමඩගම පෙර පාසල සම්බන්ධව වැලිමඩ ප්‍රාදේශීය සභාවට ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි බව සාකච්ඡාවූ අතර, මේ සම්බන්ධව කටයුතු කරන ලෙස දන්වාමුල් ළමාවිය සංවර්ධන අධිකාරියට ලිපියක් යොමු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී.

බෝගහකුඹුර ප්‍රාදේශීය සභාවේ පෙර පාසල සදහාදැනට ළමුන් 36ක් සිටින බැවින් මෙම පෙර පාසල සදහාආපසු ළමුන් ඇතුලත් කර නොගැනීමටත්, දැනට අය කරනු ලබන ගාස්තුවම අය කර,දැනට පවත්වාගෙන යන අයුරින්ම ඉදිරියටත් පෙර පාසල පවත්වාගෙන යාමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සදහාමහ සභාඅනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී ඩී.පී.ජයතිලක මන්ත්‍රීතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

4. **කඩ කුලී සංශෝධනය කිරීම සම්බන්ධව ඒ.ආර්.පී.එස්.ආර්.අමරසිංහ මහතාඉදිරිපත් කර ඇති ලිපිය**

ඒ.ආර්.පී.එස්.ආර්.අමරසිංහ මහතාවිසින් මලු කඩ අංක 02/03/04/05 සඳහාදෛනිකව ගෙවන කඩ කුලිය 2023.01.01 දින සිට වැඩි කිරීමෙන් ඉතාඅසීරු තත්වයකට පත්ව ඇති බවත් දැනට රටේ පවතින ආර්ථික තත්වය අනුව ව්‍යාපාරික කටයුතු සිදු කරනු ලබන්නේ ඉතාඅසීරු තත්වයෙන් බැවින් යම් සහනයක් ලබාදෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

මළු කඩ සඳහාඅය කරන ගාස්තු සංශෝධනය කිරීමට නොහැකි බව මුදල් කමිටුව සාකච්ඡාකල අතර, දැනට අය කරනු ලබන ගාස්තුවම අය කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභාඅනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී නානායක්කාර මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

5. **බෝගහකුඹුර වෙළඳ සංකීර්ණයේ අංක 04 දරණ කඩ කාමරය සම්බන්ධව තලන්නෙකුඹුර උප කාර්යාලයේ කාර්ය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය**

බෝගහකුඹුර වෙළඳ සංකීර්ණයේ අංක 04 ඩබ්.එම් සෝමසිරි මයාට අයත් කඩ කාමරය , සෝමසිරි මයාගේ වැඩිමහල් පුතු ඩබ්.එම්.ෂශිත් ෂමීර මල්තුෂාන් මයාහට පවරාදෙන ලෙස පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කරමින් ඉල්ලීමක් කර ඇති බව සඳහන් කරමින් තලන්නෙකුඹුර උප කාර්යාලයේ කාර්ය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

- ඩබ්.එම්.සෝමසිරි මයාගේ ඉල්ලීම් ලිපිය, විවාහ සහතිකය, හඳුනුම්පතේ පිටපත හාඋප්පැන්න සහතිකයේ පිටපත
- බිරිඳ වන එම්.පී.කරුණාවතී මියගේ ඉල්ලීම් ලිපිය, හඳුනුම්පතේ පිටපත හාඋප්පැන්න සහතිකයේ පිටපත
- වැඩිමහල් පුතාවන ඩබ්.එම්.ෂශිත් මල්තුෂාන් මයගේ ඉල්ලීම් ලිපිය, හඳුනුම්පතේ පිටපත, උප්පැන්න සහතිකයේ පිටපත හාදිවුරුම් ප්‍රකාශය
- ඩබ්.එම්.දේව් ශ්‍රී නේත්‍ර රත්තරු පුතුගේ හා ඩබ්.එම්.මල්සා නෙත්සරණි දියණියගේ උප්පැන්න සහතිකයේ පිටපත්,දිවුරුම් ප්‍රකාශ හාපැවරීමට විරුද්ධත්වයක් නොමැති බවට ලිපි

ඒ අනුව බෝගහකුඹුර වෙළඳ සංකීර්ණයේ අංක 04 දරණ කඩ කාමරය ඩබ්.එම් සෝමසිරි මයාගේ ඉල්ලීම පරිදි සෝමසිරි මයාගේ වැඩිමහල් පුතු ඩබ්.එම්.ෂශිත් ෂමීර මල්තුෂාන් මයාහට පැවරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී ඩී.පී.ජයතිලක මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

6. **කඩ කාමර දෙකක් ඒකාබද්ධ කිරීම සඳහාප්‍රසන්න උපාලි වීරසිංහ මහතා හාචන්ද්‍රිකාකුමාරි නවරත්න මිය ඉදිරිපත් කර ඇති ලිපිය**

වලිමඩ බස් නැවතුම්පලෙහි පිහිටි අංක 04 හාඅංක 05 දරණ කඩ කාමර දෙක ඒකාබද්ධ කර ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට අවසර ලබාදෙන ලෙස ඉල්ලමින් අංක 04 හාඅංක 05 දරණ කඩ කාමර හිමි ප්‍රසන්න උපාලි වීරසිංහ මහතාහාචන්ද්‍රිකාකුමාරි නවරත්න මිය ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්චාකරන ලදී. මෙම කඩ කාමර දෙක එකට සම්බන්ධ කිරීමට අවසර ලබාදීම සුදුසු බව කාර්මික නිලධාරී විසින්ද වාර්තාකර ඇත.

ඒ අනුව වලිමඩ බස් නැවතුම්පලෙහි පිහිටි අංක 04 හාඅංක 05 දරණ කඩ කාමර දෙක ඒකාබද්ධ කිරීම කාර්මික නිලධාරී අධීක්ෂණය මත සිදු කර ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට අවසර ලබාදීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී වී.රාමලිංගම් මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

7. **වලිමඩ බස් නැවතුම්පල අසල දේශීය එළවළු හාකොළකඳ වෙළඳාම් කිරීම සඳහාඅවසර ඉල්ලාඑම්.ජී.ගුණදාස මයා ඉදිරිපත් කර ඇති ලිපිය**

වලිමඩ බස් නැවතුම්පල අසල දේශීය එළවළු හාකොළකඳ වෙළඳාම් කිරීම සඳහාකුඩාඉඩ ප්‍රමාණයක් ලබාදෙන ලෙස ඉල්ලමින් ඒ සඳහා මාසිකව සාධාරණ කුලියක්ද අය කර ගන්නාලෙස දන්වමින් එම්.ජී.ගුණදාස මයාඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

ඒ අනුව 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහාදිනකට රු.200.00 බැගින් කුලී මුදල් අය කර වලිමඩ බස් නැවතුම්පල අසල දේශීය එළවළු හාකොළකඳ වෙළඳාම් කිරීම සඳහාඅවසර ලබාදීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභාඅනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද එහිදී මේ සම්බන්ධව ගරු සභාව විසින් සාකච්ඡාකිරීමෙන් අනතුරුව මේ සඳහාඅවසර ලබාදීම තුළින් ඉදිරියේදී ගැටළු රැසකට මුහුන පෑමට සිදු වන බැවින් මෙය ක්‍රියාත්මක නොකිරීමට තීරණය කරන ලදී. එම තීරණය ඇතුලත් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් ප්‍රේමලාල් මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාවිසින් ගෙන ආ මෙම යෝජනාව ක්‍රියාත්මක නොකිරීමට 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

8. **කප්පෙටිපොල ඩිපෝව අසල කුඩාකඩයක් පවත්වාගෙන යාමට අවසර ඉල්ලාඑම්.චන්ද්‍රාවතී මිය ඉදිරිපත් කර ඇති ලිපිය**

දැනට අවුරුදු 04 ක පමණ කාලයක සිට කප්පෙටිපොල ඩිපෝව අසල කුඩාකඩයක් සහෝදරිය සමගින් පවත්වාගෙන ගිය බවත්, සහෝදරිය වන සීලවතී මහත්මිය මිය ගිය හෙයින් දැනට ජීවත් වීමට කිසිම ආදායමක් නොමැති බැවින් එම කුඩාකඩය පවත්වාගෙන යාමට අවසර ලබාදෙන ලෙස ඉල්ලමින් එම්.චන්ද්‍රාවතී මිය ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී. මෙම ස්ථානය පරීක්ෂාකරන ලද ආදායම් පරීක්ෂක නිලධාරී විසින් වාර්තාකර ඇත්තේ මෙම ඉඩම් කොළඹ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් බවයි.

ඒ අනුව මෙම කඩය පවත්වාගෙන යනු ලබන ඉඩම් කොළඹ ප්‍රාදේශීය සභාවට අයත් නොවන බැවින් කඩය පවත්වාගෙන යාමට ප්‍රාදේශීය සභාවට අවසර ලබදීමට නොහැකි බවත්, වෙනත් ආයතනයකින් කඩය ඉවත් කල හොත් එම ස්ථානයෙන් ඉවත් වීමට සිදු වන බවත් දන්වාඑම්.චන්ද්‍රාවතී මිය හට ලිපියක් යොමු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභාඅනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී වජිර දෙනගම මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

9. **පළාත් පාලන ආයතන වල නාගරික සංවර්ධනය සඳහාවූ බැංකු ගිණුම සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් යොමු කර ඇති ලිපිය**

නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාවිසින් නිකුත් කරන ලද සළසුම් චක්‍රලේඛ 15 යටතේ පළාත් පාලන ආයතන තුල නාගරික සංවර්ධනය සඳහාවූ විශේෂ බැංකු ගිණුමක් පවත්වාගෙන යුතු අතර, මෙම ගිණුම පවත්වාගෙන යාමේ ප්‍රධාන අරමුණ වන්නේ එහි තැන්පත්කරන මුදල් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහානාගරික සංවර්ධන අධිකාරියේ අනුමතිය මත යොදාවාගත හැකි වීම බවත්, ආයතනයේ නාගරික සංවර්ධනය සඳහාවෙනම ගිණුමක් නොමැති නම් ගිණුමක් ආරම්භ කරන ලෙස දන්වමින් නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් යොමු කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

ඒ අනුව නාගරික සංවර්ධනය සඳහාවූ විශේෂ බැංකු ගිණුමක් රජ්‍ය බැංකුවක ආරම්භ කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභාඅනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී මුත්තලිප් මහතාතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**10. බස් නැවතුම්පොළ අංක 01 කඩ කාමරය සම්බන්ධව ගරු සභාපතිතුමාඉදිරිපත් කර ඇති ලිපිය**

බස් නැවතුම්පොළ අංක 01 කඩ කාමරයෙහි ඉදිකිරීම් කටයුතු 2022.12.31 දින වන විට අවසන් කරන ලෙස පී.ටී.පී. සිල්වාමයාදැනුවත් කර ඇති අතර, මේ වන විට එම කඩයෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර, පරීක්ෂන් කිරීමට පමණක් ඉතිරිව ඇත.

මෙම කඩ කාමරය සම්බන්ධව විමර්ශන වාර්තාවක් ද පවතින අතර, 2022.12.31 වන දින තෙක් රු.950.40 ක මාසික බදු කුලියක් යටතේ ඉදිකරමින් පවතින ගොඩනැගිල්ලක් ලෙස ගිවිසුම් ගතවී ඇති බැවින් මෙම කඩ කාමරයෙහි රජයේ තක්සේරුව ලැබෙන තෙක් තාවකාලික තක්සේරුවකට යටත්ව ගිවිසුම්ගත වීමට අනුමතිය ලබාගැනීම සඳහාගරු සභාපතිතුමාඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්චාකරන ලදී.

ඒ අනුව තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුවක් අනුව බස් නැවතුම්පොළ අංක 01 කඩ කාමරය ලබාදීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභාඅනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී වසන්ත නානායක්කාර මහතාතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**11. LDSP PT2 වැඩසටහන යටතේ හෙළ බොජුන් හල් 04ක් ස්ථාපිත කිරීමට හා හුලංකපෙල්ල නැරඹුම් ස්ථානය සංවර්ධනයට අදාළ පාරිසරික වාර්තාව සඳහාඅනුමතිය ලබාගැනීමසඳහා ගරු සභාපතිතුමාඉදිරිපත් කර ඇති ලිපිය**

LDSP PT2වැඩසටහන යටතේ දේශීය ආහාර ද්‍රව්‍ය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතියක් ලෙස හුලංකපෙල්ල, ඩයරබා බෙරගලන්ද, කප්පෙටිපොළ යන ස්ථාන සඳහාහෙළ බොජුන්හල් 04ක් ස්ථාපිත කිරීමට සහ හුලංකපෙල්ල නැරඹුම් ස්ථානය සංවර්ධනයට අදාළ පාරිසරික වාර්තාව සඳහාඅනුමතිය ලබාගැනීම සඳහාගරු සභාපතිතුමාඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

ඒ අනුව හුලංකපෙල්ල, ඩයරබා බෙරගලන්ද, කප්පෙටිපොළ යන ස්ථාන සඳහාහෙළ බොජුන්හල් 04ක් ස්ථාපිත කිරීමට සහ හුලංකපෙල්ල නැරඹුම් ස්ථානය සංවර්ධනයට අදාළ පාරිසරික වාර්තාව මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභාඅනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී ඉල්ලියාස් මහතාතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**12. LDSP ව්‍යාපෘතියේ තාක්ෂණික ඇගයීම් කමිටුව නම් කිරීම සම්බන්දව ගරු සභාපතිතුමාඉදිරිපත් කරඇති ලිපිය**

වලිමඩ ප්‍රාදේශීය සභාවේ LDSP ව්‍යාපෘතියේ තාක්ෂණික ඇගයීම් කමිටුව පහත සඳහන් පරිදි පත් කිරීම සඳහාඅනුමතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමාඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

01. ටී.සෙන්තූර් කුමාර් මයා- දිස්ත්‍රික් ඉංජිනේරු, පළාත් පාලන දෙපාර්තමේන්තුව- සභාපති
02. කාංචනාවීරසිංහ මිය -කාර්මික නිලධාරී, ප්‍රාදේශීය සභාව, වලිමඩ - සාමාජික
03. සමන්ත සූරියගේ මයා- කාර්ය භාර නිලදාරී, ආර්ථික මධ්‍යස්ථානය,කප්පෙටිපොළ -සාමාජික

ඒ අනුව වලිමඩ ප්‍රාදේශීය සභාවේ LDSP ව්‍යාපෘතියේ ඉහත නම් සඳහන් තාක්ෂණික ඇගයීම් කමිටුව මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභාඅනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී මුත්තලිප් මහතාතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**13. LDSP වැඩසටහන යටතේ හෙළ බොජුන්හල් හාපොදු වැසිකිළි ඉදි කිරීමට අපේක්ෂිත බැවින් දැනට භාවිතාකරන පොදු වැසිකිළි කඩාඉවත් කිරීම සඳහාඅනුමතිය ලබාගැනීම සඳහාගරු සභාපතිතුමාඉදිරිපත් කර ඇති ලිපිය**

LDSP PT2 වැඩසටහන යටතේ 2022 වර්ෂය සඳහාවලිමඩ ප්‍රාදේශීය සභාවට රුපියල් මිලියන 24.7ක් වෙන් කර ඇත.

මෙම මුදල් යොදාගනිමින් දේශීය ආහාර ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතියක් ලෙස පහත සඳහන් ස්ථාන මුල් කර ගනිමින් හෙළ බොජුන්හල් 04ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත.

01. හුලංකපෙල්ල - හග්ගල - පොදු සුසාන භූමි ඉඩම
02. ඩයරබාමංසන්දිය - උප කාර්යාළ පිහිටි පරිශ්‍රය
03. කප්පෙටිපොළ නගරය - මහජන වැසිකිලිය පිහිටි ඉඩම
04. බෙරගලන්ද නගරය - මහජන වැසිකිලිය පිහිටි ඉඩම

ඒ අනුව කප්පෙටිපොළ නගරය හා බෙරගලන්ද නගරයේ ප්‍රාදේශීය සභාවට අයත් පොදු වැසිකිලි කඩා ඉවත් කර එම භූමියේ හෙළ බොජුන්හල් හාපොදු වැසිකිලි ඉදි කිරීමට අපේක්ෂිත බැවින් දැනට භාවිතාකරන පොදු වැසිකිලි කඩාඉවත් කිරීම සඳහාඅනුමතිය ලබාගැනීම සඳහාගරු සභාපතිතුමාඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

ඒ අනුව කප්පෙටිපොළ නගරය හාබෙරගලන්ද නගරයේ ප්‍රාදේශීය සභාවට අයත් පොදු වැසිකිලි කඩාඉවත් කර එම භූමියේ හෙළ බොජුන්හල් හාපොදු වැසිකිලි ඉදි කිරීමට අපේක්ෂිත බැවින් දැනට භාවිතාකරන පොදු වැසිකිලි කඩාඉවත් කිරීම සඳහාඅනුමතිය ලබාදීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභාඅනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද අතර එහිදී මේ සම්බන්ධව ගරු සභාව විසින් දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු මන්ත්‍රී ඉන්දික සම්පත් මහතාතුමා පවසා සිටියේ සියළුම මන්ත්‍රීවරුන්ගේ එකගතාවය පරිදි තමාමෙම යෝජනාව සංශෝධනය කරන බවයි. එනම් LDPSව්‍යාපෘති යෝජනාවේ කප්පෙටිපොළ හාබෙරගලන්ද පොදු වැසිකිලි කඩාඉවත් කර බොජුන්හල් ඉදිකිරීම යන යෝජනාසම්බන්ධව අප දැනුවත් වූයේ මුදල් කමිටු වාර්තාව ලැබුණු පසු බවත්, එම නිසා මෙමෙ බොජුන්හල් කප්පෙටිපොළ හා බෙරගලන්ද නගර මධ්‍යයේ ඉදි නොකර ගරු මන්ත්‍රී මණ්ඩලයේ 41දෙනා සමඟ සාකච්ඡා කර තීරණයක් ගෙන පසුව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනාව සංශෝධනය කරන ලදී. එම සංශෝධිත යෝජනාව ගරු මන්ත්‍රී කරුණාරත්න බණ්ඩාර මහතාතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව මෙම සංශෝධිත යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**14. LDSP ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කමිටුව සඳහාඅනුමතිය ලබාගැනීමට ගරු සභාපතිතුමාඉදිරිපත් කර ඇති ලිපිය**

වලිමඩ ප්‍රාදේශීය සභාවේ LDSP ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කමිටුව පහත සඳහන් පරිදි නම් කිරීම සඳහා අනුමතිය ලබාගැනීමට ගරු සභාපතිතුමා ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

01. ගරු සභාපති එස්.ඒ.ආර්.බන්දුසේන මහතාතුමා- සභාපති
02. ගරු මන්ත්‍රී ආර්.බී.ජයතිලක මහතාතුමා- සාමාජික
03. ගරු මන්ත්‍රී එම්.එම්.දයාරත්න මහතාතුමා- සාමාජික
04. ගරු මන්ත්‍රී ඩී.පී.ජයතිලක මහතාතුමා- සාමාජික
05. ගරු මන්ත්‍රී අජිත් කුමාර මහතාතුමා- සාමාජික
06. සභා ලේකම් ඩී.එම්.පී.එස්.බණ්ඩාර මයා- සාමාජික
07. සංවර්ධන නිලධාරී ආර්.එම්.බී.පී.රාජපක්ෂ මයා- සාමාජික
08. කාර්මික නිලධාරී කපිල මනෝරත්න මයා- සාමාජික

ඒ අනුව වලිමඩ ප්‍රාදේශීය සභාවේ LDSP ව්‍යාපෘතියේ ඉහත නම් සඳහන් ප්‍රසම්පාදන කමිටුව මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනාකරන ලද අතර එහිදී ගරු සභාව විසින් මේ සම්බන්දව සාකච්ඡාකිරීමෙන් අනතුරුව මෙම ප්‍රසම්පාදන කමිටුව අවලංගු කර නැවත පත් කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව එම තීරණය ඇතුලත් යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**15. LDSP වැඩසටහන යටතේ කැප්පෙටිපොළ පොළ හා වෙළඳ සංකීර්ණය ඉදි කිරීමේදී පිහිටුවාගන්නාලද සමාජ විගණන කමිටුව සඳහා අනුමතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කර ඇති ලිපිය**

LDSP වැඩසටහන යටතේ කැප්පෙටිපොළ පොළ හා වෙළඳ සංකීර්ණය ඉදි කිරීමේදී පිහිටුවාගන්නාලද සමාජ විගණන කමිටුව සඳහා අනුමතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

01. ආර්.එම්.චන්දන ජගත් රත්නායක මයා, පියසෙවන,හෙට්ටිගෙදර,කැප්පෙටිපොළ
02. එස්.ඒ.ආර්.ඥානවතී මන්ත්‍රීතුමිය, 46 සී, හපුතලේ පාර, කැප්පෙටිපොළ
03. ඩී.එච්.ජයන්ත දිසානායක මයා, කරගස්වගුර, කැප්පෙටිපොළ
04. එල්.එම්.කුමාරසිංහ මයා, කොකටියරෙදෑ, කැප්පෙටිපොළ
05. ඉන්ද්‍රාණි විතානගේ මිය, නිදන්ගොඩ, කැප්පෙටිපොළ
06. ආර්.එම්.කරුණාසිරි රත්නායක මයා, නො12, වැවතැන්න, කැප්පෙටිපොළ
07. එස්.එච්.එම්.චන්ද්‍රනී සමරසේකර මිය, සමන්ගිරි, අම්පිටිතැන්න, වීරබැද්ද
08. එස්.එච්.එම්.විජේසිරි මයා, මල්අත්තාගල, එරබැද්ද, කැප්පෙටිපොළ
09. එච්.දේවිකාශ්‍රියාණි මිය, මල්අත්තාගල, එරබැද්ද, කැප්පෙටිපොළ

ඒ අනුව LDSP වැඩසටහන යටතේ කැප්පෙටිපොළ පොළ හා වෙළඳ සංකීර්ණය ඉදි කිරීමේදී පිහිටුවාගන්නාලද සමාජ විගණන කමිටුව සඳහා අනුමතිය ලබාදීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනාකරන ලද අතර එහිදී ගරු සභාව මේ සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡාකිරීමෙන් අනතුරුව ඉදිරිපත් කර ඇති LDSP වැඩසටහන යටතේ කැප්පෙටිපොළ පොළ වෙළඳ සංකීර්ණය ඉදි කිරීමේදී පිහිටුවාගන්නාලද සමාජ විගණන කමිටුව අවලංගු කිරීමටත් විනිවිදභාවයකින් යුතුව නැවත එම කමිටුව පත් කර ගැනීමටත් තීරණය කරන ලදී. එම යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රභාත් රවීන්ද්‍ර මහතාතුමා විසින් ස්ථිර කරන ලදී. එම තීරණය ඇතුලත් සංශෝධිත යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**16. පුස්තකාල සඳහා පොත් සැපයීම සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්තුමා යොමු කර ඇති ලිපිය**

රාජකීය පණ්ඩිත රදලියද්දේ සීලානන්ද හිමියන් විසින් රචිත විභාග ජයමග අංක 03 බුද්ධ ධර්මය විභාග තරණය කෘතිය පුස්තකාල සඳහා 2023 වර්ෂය සඳහා පොත් මිලදී ගැනීමේදී ලබාගැනීමට විශේෂ අවධානය යොමු කරන ලෙස දන්වමින් පළාත් පාලන කොමසාරිස්තුමා යොමු කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්චාකරන ලදී. මෙම ග්‍රන්ථය වදගත් හා අවශ්‍ය ග්‍රන්ථයක් බව පුස්තකාලාධිපතිතුමිය විසින්ද දන්වා ඇති බැවින් මෙම ග්‍රන්ථය පුස්තකාල සඳහා මිලදී ගැනීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී නාලක ප්‍රියන්ත මහතාතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**17. පොළ භූමියේ කඩ කාමරය සම්බන්ධව වලිමඩ විවිධ සේවා සමූපකාර සමිතිය විසින් යොමු කර ඇති ලිපිය**

පොළ භූමියේ අංක 22 කඩ කාමරය වලිමඩ විවිධ සේවාසමූපකාර සමිතිය වෙත ලබාගැනීම සඳහා රු.118900.00 ක මුදලක් ගෙවූ අතර, මෙම කඩ කාමරය ප්‍රමාණවත් නොවන බැවින් වෙනත් කඩ කාමරයක් ලබාදෙන ලෙස ඉල්ලීම් කලත් එම ඉල්ලීම ඉටු නොවීම නිසා අංක 22 කඩ කාමරය ලබාගැනීමට තීරණය කර ඇති බැවින් ගිවිසුම්පත් පිළියෙල කර කම කඩ කාමරය ලබාදීමට කටයුතු කරන ලෙස දන්වමින් වලිමඩ විවිධ සේවාසමූපකාර සමිතියේ සාමාන්‍යාධිකාරී විසින් යොමු කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්චාකරන ලදී.

ඒ අනුව වලිමඩ පොළ භූමියේ අංක 22 කඩ කාමරය වලිමඩ විවිධ සේවාසමූපකාර සමිතිය වෙත සභාව විසින් පනවනු ලබන කොන්දේසි වලට යටත්ව ලබාදීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී නානායක්කාර මහතාතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**18. 2023 වර්ෂය සඳහා බෙරගලන්ද පොළ භූමියේ බදු අයිතිය ලබාගැනීමේ ටෙන්ඩරය සම්බන්ධව ගරු සභාපතිතුමා ඉදිරිපත් කර ඇති ලිපිය හා බෙරගලන්ද පොළ භූමියේ ගාස්තු අය කිරීමේ අයිතිය ටෙන්ඩර් කිරීමේ පෙර්මි ගාස්තු සම්බන්ධව ආර්.එම්.විමලවතී මිය ඉදිරිපත් කර ඇති ලිපිය**

2023 වර්ෂය සඳහා බෙරගලන්ද පොළ භූමියේ බදු අයිතිය ලබාගැනීමේ ටෙන්ඩරය ලබාගත් ආර්.එම්.විමලවතී මිය හට ගිවිසුම්ගත වීමට පැමිණෙන ලෙස ලිඛිතව හා වාචිකව දැනුම් දුන්නද මේ වන තෙක් ඒ සඳහා නොපැමිණි අතර, 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල ටෙන්ඩර් කුලියද ගෙවා නොමැති බව දන්වමින් ඉදිරි කටයුතු සිදු කිරීම සම්බන්ධව සාකච්ඡාකිරීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

එමෙන්ම 2021 වර්ෂයේ බෙරගලන්ද පොළ භූමියේ ගාස්තු අය කිරීමේ අයිතිය ලබාගැනීම සඳහා ගෙවන ලද ටෙන්ඩර් පෙර්මි ගාස්තු ලබා දෙන ලෙස ඉල්ලමින් කන්දේපුහුල්පොළ, අරාංගෙදක පදිංචි ආර්.එම්.විමලවතී මිය ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන

ලදී. ආර්.එම්.විමලවතී මියගෙන් 2022 වර්ෂය සඳහා රු.7750.00 ක මුදලක් හිග බව බෙරලන්ද කාර්ය භාර නිලධාරී විසින් ද වාර්තාකර ඇත.

ඒ අනුව 2023 වර්ෂයට අදාළ ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධව ආදායම් පරීක්ෂක මගින් ආර්.එම්.විමලවතී මිය දැනුවත් කර ආදායම් පරීක්ෂක වාර්තාවක් ලබාගැනීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී ඩී.පී.ජයතිලක මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**19. දිමුතුගම පොදු සුසානභූමිය ප්‍රතිසංස්කරණය කිරීමට අනුමතිය ලබාගැනීම සම්බන්ධව ගරු උප සභාපතිතුමිය ඉදිරිපත්කර ඇති ලිපිය**

දිමුතුගම පොදු සුසානභූමිය වටා වැට ගැසීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලමින් ගරු උප සභාපතිතුමිය සීතා සමරවීර මන්ත්‍රීණිය ඉදිරිපත්කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

ඒ අනුව මෙම සුසාන භූමිය මැනීම සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා වලිමඩ ප්‍රාදේශීය ලේකම්තුමා වෙත ලිපි යොමු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී ප්‍රභාත් රවීන්ද්‍ර මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**20. 2023 වර්ෂයේ සවි කරනු ලබන සෝලාලාම්පු 125 සඳහා රක්ෂණාවරණය ලබාගැනීම සම්බන්දව ගරු සභාපතිතුමා ඉදිරිපත් කර ඇති ලිපිය**

2023 වර්ෂයේ සවි කරනු ලබන සෝලාලාම්පු 125 සඳහා රක්ෂණාවරණය ලබාගැනීම සඳහා අවශ්‍ය මිල ගණන් කැඳවීමට අනුමතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලද අතර, 2023 වර්ෂයේ සවි කරනු ලබන සෝලා ලාම්පු 125 සඳහා රක්ෂණාවරණය ලබාගැනීම සඳහා රක්ෂණ ආයතන සියල්ලේම මිල ගණන් කැඳවීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී ඩී.පී.ජයතිලක මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**21. වේදිකාව ගොඩනැගිල්ලේ තෙවන මහල දීර්ඝ කාලීන බදු පදනම මත ලබා ගැනීම සම්බන්ධව පී.ඩබ්.රංජිත් ධර්මකීර්ති මයා ඉදිරිපත් කර ඇති ලිපිය**

වලිමඩ වේදිකාව ගොඩනැගිල්ලේ තුන්වන මහල දීර්ඝ කාලීන බදු පදනම මත ලබාගැනීම සඳහා ලබාදී ඇති නිර්දේශයන්ට එකඟ නොවන බවත්, තුන්වන මහලක සාර්ථක ව්‍යාපාරයක් කර ගෙන යාමට අපහසු අතර, ලක්ෂ 15ක පමණ ඇප තැන්පතුවක් තබා තමාගේ වියදමින් ගොඩනැගිල්ල සකස් කිරීමට නොහැකි බවත්, තුන්වන මහලේ අනුමත වැඩ කටයුතු සිදු කිරීමට විශාල මුදලක් වැය වන බවත්, තුන්වන මහල තම වියදමින් සකස් මසික කුලිය රු.5000.00 බැගින් ගෙවීමටත්, ඇප තැන්පත් වශයෙන් රු.100,000.00ක් ගෙවීමට එකඟ වන බවත් පවසමින් පී.ඩබ්.රංජිත් ධර්මකීර්ති මයා ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්චාකරන ලදී.

ඒ අනුව වේදිකාව ගොඩනැගිල්ලේ තෙවන මහල දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීම සඳහා පී.ඩබ්.රංජිත් ධර්මකීර්ති මයාගෙන් තැම්පතු මුදල් වශයෙන් ලක්ෂ 10ක මුදලක් ලබාගැනීමටත්, කඩ කාමරය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කරනු ලබන මුදල කඩ කුලී වශයෙන් අය කිරීමටත් මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී මුත්තලිප් මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**22. දැනට සවි කර ඇති වීදි ලාම්පු 51 සඳහා 2023 වර්ෂයට රක්ෂණ වාරික ගෙවීම සම්බන්දව ගරු සභාපතිතුමා ඉදිරිපත් කර ඇති ලිපිය**

වලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දැනට සවි කර ඇති වීදි ලාම්පු 51 සඳහා පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී. ආයතනයෙන් 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති රු.131054.55 ක මුදල ගෙවීම් කිරීම සඳහා අනුමතිය ලබාගැනීම සම්බන්ධව ගරු සභාපතිතුමා ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී. ඒ අනුව දැනට සවි කර ඇති වීදි ලාම්පු 51 සඳහා 2023 වර්ෂයට රක්ෂණ වාරික වශයෙන් රු.131054.55 ක මුදලක් පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී. ආයතනය වෙත ගෙවීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී ඩී.පී.ජයතිලක මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**23. වලිමඩ පොළ භූමියේ රක්ෂණ වාරික ගෙවීම සම්බන්දව ගරු සභාපතිතුමා ඉදිරිපත් කර ඇති ලිපිය**

වලිමඩ සති පොළ සංකීර්ණයේ රක්ෂණ වාරික ගෙවීමට අදාලව පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී. ආයතනයෙන් ඉදිරිපත් කර ඇති පහත සඳහන් අලුත්කිරීමේ නිවේදන දෙක අනුමත කර ගැනීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්චාකරන ලදී.

01. වලිමඩ සතිපොළ සංකීර්ණයේ දේපල රක්ෂණාවරණය සඳහා ගාස්තු රු.88511.08
02. වලිමඩ සතිපොළ සංකීර්ණයේ පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය සඳහා ගාස්තු රු.12194.62

ඒ අනුව වලිමඩ සති පොළ සංකීර්ණයේ රක්ෂණ වාරික ගෙවීමට අදාලව පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී. ආයතනයෙන් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් අලුත්කිරීමේ නිවේදන දෙක අනුව ගෙවීම් සිදු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී ඉල්ලියාස් මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**24. වෙළඳ ආයතනය සම්බන්ධ දැන්වීම් පුවරු වෙළඳ සංකීර්ණය ඉදිරිපිට ප්‍රදර්ශනය කිරීම සම්බන්ධව ආර්.එම්.වජිර ප්‍රසන්න රත්නායක මයා ඉදිරිපත් කර ඇති ලිපිය**

වලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට ඇති වෙළඳ සංකීර්ණය තුල රීසි ටෙක්නොලොජි නමින් මුද්‍රණ කටයුතු සම්බන්ධ ආයතනයක් පවත්වාගෙන යන බැවින් ඒ සඳහා දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ඉල්ලා ආර්.එම්.වජිර ප්‍රසන්න රත්නායක මයා ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්චාකරන ලදී.

ඒ අනුව කඩ කාමරයේ ප්‍රමාණය අනුව එක සමාන දන්වීම් පුවරු සවි කිරීම සුදුසු බවට 2023.01.09 දින පැවති මුදල් කමිටුවේ සාකච්ඡා කල පරිදි ආදායම් පරීක්ෂක වාර්තාවක් ලබාගෙන ඉදිරි මහ සභාවට යොමු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී නානායක්කාර මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.02.27 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

25. **සෞඛ්‍ය අංශය සඳහා අවශ්‍ය භාණ්ඩ හා උපකරණ ලබාගැනීම හා CCTV කැමරා ලබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපි**

සෞඛ්‍ය අංශය සඳහා පහත සඳහන් උපකරණ හා වැලිමඩ සිට හපුතලේ පාර 04 කණුව දක්වා ප්‍රධාන පාර දෙපස අවිධිමත් ලෙස කසල බැහැර කිරීම පාලනය කිරීමට නොහැකි බැවින් CCTV කැමරා දෙකක් සවි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා සංවර්ධන නිලධාරී පී.එස්.එම්.ඩබ්.බණ්ඩාර මයා ඉදිරිපත් කර ඇති ලිපි ගරු සභාපතිතුමා විසින් මුදල් කමිටුවට ඉදිරිපත් කර ඇත.

01. සවල් 10
02. උදලු මුල්ලු 10
03. රේක්ක 20
04. වක් පිහි 05
05. බැග් මහන මැෂින් 01
06. කොම්පෝස්ට් ඇසුරුම් බෑග් 10000
07. නූල් කෝන් 50
08. වැට කපන කුතුරු 04
09. ඉදල් 500
10. සබන් 1000
11. කාණු බ්‍රෂ් 20
